අධිකරණ සේවා කොමිෂන් සභාව, කොළඹ 12.

நீதிச்சேவை ஆணைக்குழு, கொழும்பு 12.

Judicial Service Commission, Colombo 12.

2025

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ஆண்டு செயல்திறன் அறிக்கை

Annual Performance Report



වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2025

අධිකරණ සේවා කොමිෂන් සභාව

පටුන

පිටු අංක

කෙටියෙදුම්.....03

01 - අධිකරණ සේවා කොමිෂන් සභාවේ සංයුතිය හා ව්‍යුහය.....04-10

02 - ආයතනයේ ප්‍රගතිය හා ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග 11-19

03 - **2025** වර්ෂය සඳහා මූල්‍ය සමාලෝචනය.....20-32

04 - කාර්ය සාධන දර්ශක.....33-36

05 - තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය.....37-38

06 - අධිකරණ සේවා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පිළිබඳ සාරාංශය.....39-41

07 - අනුකූලතා වාර්තාව.....42-53

භාවිතා කළ කෙටි යෙදුම්

01. ස.ලේකම් - සහකාර ලේකම්
02. අ.හ.වි. නිලධාරි - අභ්‍යන්තර විගණන නිලධාරි
03. ස.වි. නිලධාරි - සහකාර විමර්ෂණ නිලධාරි
04. පරිපාලන නි. - පරිපාලන නිලධාරි
05. වැඩසටහන් ස.නි - වැඩසටහන් සහකාර නිලධාරි
06. භාෂා පරිව. - භාෂා පරිවර්තක
07. තො.ස.තා නිලධාරි - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි
08. ය.ලේ - යතුරු ලේඛක
09. ලඝු.ලේ - ලඝු ලේඛක
10. භාෂණ පරිව. - භාෂණ පරිවර්තක
11. රා.ක.ස - රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරි
12. පො.බැ - පොත් බැඳුම්කරු
13. කා.කා.ස. - කාර්යාල කාර්ය සහයක

අධිකරණ සේවා කොමිෂන් සභාවේ සංයුතිය හා ව්‍යුහය

අපගැන

1.1 අධිකරණ සේවා කොමිෂන් සභාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **111** ඈ ව්‍යවස්ථාව මගින් අධිකරණ සේවා කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත. අධිකරණයේ ස්වාධීනත්වය සුරැකීම, ස්වාධීන කොමිෂන් සභාවක් වශයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව පිහිටුවීමේ පරමාර්ථය වේ. අධිකරණ සේවා කොමිෂන් සභාව ගරු අග්‍රවිනිශ්චයකාරතුමා සහ අතිගරු ජනාධිපතිතුමා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **41** ඇ ප්‍රතිපාදනවලට යටත්ව පත් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් දෙදෙනෙකුගෙන් සමන්විතය. ගරු අග්‍රවිනිශ්චයකාරතුමා නිල බලයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති වේ. අධිකරණ සේවා කොමිෂන් සභාවට ලේකම්වරයකු කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන අතර, ඔහු හෝ ඇය මුල් අවස්ථා අධිකරණ විනිශ්චයකාරවරුන් අතරින් පත්කරනු ලබන්නේ ය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති වශයෙන් මීට පෙර කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් ක්‍රියා කරන ලද ගරු මුර්දු ප්‍රනාන්දු මැතිණිය **2024** වර්ෂයේ දෙසැම්බර් මස **02** වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **48** වන අග්‍රවිනිශ්චයකාර වශයෙන් පත් වන ලද අතර, 2025.07.27 දින එතුමිය විශ්‍රාම ගැනීමෙන් අනතුරුව, එවකට අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් ක්‍රියා කල පී. පද්මන් සූරසේන මැතිතුමා 2025.07.27 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **49** වන අග්‍රවිනිශ්චයකාරවරයා වශයෙන් පත් වන ලදී. ඒ අනුව නිල බලයෙන් එතුමා එදින සිට ක්‍රියාත්මක වන පරිදි අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති වශයෙන් ක්‍රියා කරනු ලබයි.

මීට අමතරව 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා කාල සීමාව අතරතුර පහත සඳහන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සෙසු සාමාජිකයින් වශයෙන් කටයුතු කරන ලදී.

ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ඊ්.ඒ.ජී.ආර්. අමරසේකර මැතිතුමා	2023.02.09 – 2025.06.17 දක්වා
ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු පී. පද්මන් සූරසේන මැතිතුමා	2024.12.30 – 2025.07.26 දක්වා

වර්තමානයේ අධිකරණ සේවා කොමිෂන් සභාවේ සෙසු සාමාජිකයින් වශයෙන් ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු එම්.ඒ. සමයවර්ධන මැතිතුමා 2025.07.25 දින සිටත්, ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු එස්. තුරෙයිරාජා මැතිතුමා 2025.08.29 දින සිටත් කටයුතු කරයි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වශයෙන් මහාධිකරණ විනිසුරු එච්.එස්.සෝමරත්න මහතා 2025.07.21 දින දක්වා කටයුතු කරන ලද අතර, ඉන් අනතුරුව 2025.07.22 දින සිට මේ දක්වා මහාධිකරණ විනිසුරු ප්‍රසන්න අල්විස් මහතා අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වශයෙන් කටයුතු කරනු ලැබේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් වශයෙන් පහත සඳහන් විනිශ්චයකාරවරුන් කටයුතු කර ඇත.

සී.එච්.ජී. ලියනගේ මහතා (ශ්‍රී ලංකා අධිකරණ සේවයේ විශේෂ ශ්‍රේණිය) 2022.04.04 දින සිට 2025.08.24 දින දක්වා

ඩී.එම්.ඩී.සී.බණ්ඩාර මහතා (ශ්‍රී ලංකා අධිකරණ සේවයේ විශේෂ ශ්‍රේණිය) 2018.02.01 දින සිට 2025.09.02 දින දක්වා

එමෙන්ම අධිකරණ සේවා කොමිෂන් සභාවේ වර්තමාන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් වශයෙන් ආනන්දි කනගරත්නම් මෙනෙවිය (ශ්‍රී ලංකා අධිකරණ සේවයේ විශේෂ ශ්‍රේණිය) 2015.03.02 දින සිට මේ දක්වා කටයුතු කරනු ලබන අතර ගරු අගවිනිසුරුතුමාගේ ලේකම් ලෙසද කටයුතු කරනු ලබයි. උද්දාල සුවන්දුරුගොඩ මහතා (ශ්‍රී ලංකා අධිකරණ සේවයේ I පන්තිය I ශ්‍රේණිය) 2025.08.25 දින සිටත්, ඩී.එම්. ජයරුවන් දිසානායක මහතා (ශ්‍රී ලංකා අධිකරණ සේවයේ I පන්තිය I ශ්‍රේණිය) 2025.09.03 දින සිටත් සෙසු ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් වශයෙන් කටයුතු කරනු ලබයි.

2025 වර්ෂයේදී අධිකරණ සේවා කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩල සංයුතිය විධායක නිලධාරීන්, මාණ්ඩලික නිලධාරීන්, කළමනාකරණ සහකාර නිලධාරීන් සහ කණිෂ්ඨ කාර්යය මණ්ඩලයෙන් සමන්විත විය.

යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහාත්, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව එය ඉෂ්ඨ සිද්ධ කිරීම සඳහාත්, අධිකරණ සේවා කොමිෂන් සභාවේ පරිපාලනයට යටත්ව දිවයින පුරා පිහිටුවා ඇති අධිකරණ පහත පරිදි දැක්විය හැක.

I.	ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණ	- 02
II.	වාණිජ මහාධිකරණ	- 01 (විවෘත අධිකරණ ශාලා 04 කින් සමන්විත)
III.	පළාත්බද මහාධිකරණ	- 34
IV.	සිවිල් අභියාචනා මහාධිකරණ	- 22
V.	දිසා අධිකරණ	- 33
VI.	දිසා/මහේස්ත්‍රාත් අධිකරණ	- 52
VII.	මහේස්ත්‍රාත් අධිකරණ	- 56
VIII.	ළමා මහේස්ත්‍රාත් අධිකරණ	- 02
IX.	කම්කරු විනිශ්චය සභා	- 39

අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා යටතේ ක්‍රියාත්මක වන කාර්යය මණ්ඩලය, අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත නීති මගින් පැවරී ඇති කාර්යයන් සහ කර්තව්‍යයන් ඉටුකිරීමෙහිලා මනා දායකත්වයක් සපයනු ලබයි.

අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කරමින් විධායකය හා ව්‍යවස්ථාදායකය අතර සංවරණ හා තුලන ක්‍රමවේදයක් පවත්වා ගනිමින් ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය වන යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ශක්තිමත් කොට වේගවත් කිරීමටත් අධිකරණ සේවා කොමිෂන් සභාව පියවර ගෙන තිබේ.

1.2 අධිකරණ සේවා කොමිෂන් සභාවේ මූලික කාර්යයන්


- මහාධිකරණ විනිසුරුවරුන්ගේ පත් කිරීම් හා විනය කටයුතු පිළිබඳව ජනාධිපතිතුමාට නිර්දේශ ඉදිරිපත් කිරීම.
- මහාධිකරණ විනිසුරුවරුන්ගේ පුහුණු කිරීම හා ගරු අගවිනිසුරුතුමාගේ නිර්දේශමත ස්ථාන මාරු කිරීම.
- මුල් අවස්ථා අධිකරණ විනිශ්චයකාරවරුන් වන දිසා විනිශ්චයකාරවරුන්, මහේස්ත්‍රාත්වරුන්, කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම් හා විනය පාලනය.
- උපලේඛනගත සේවයට අයත් රජයේ උපලේඛනගත නිලධාරීන් (එනම් අධිකරණ කාර්යය මණ්ඩලය) පත් කිරීම, ස්ථාන මාරු සිදුකිරීම, උසස් කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය.
- ව්‍යවස්ථාව මගින් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ලබා දී ඇති බලතලවලට යටත් වන අධිකරණවල පරිපාලනය හා අධීක්ෂණය.
- කම්කරු වන්දි කොමසාරිස් සහ නියෝජ්‍ය/සහකාර කම්කරු වන්දි කොමසාරිස්වරුන් පත්කිරීම. (සිය රැකියාව අතරතුරදී හදිසි අනතුරුවලට මුහුණපාන කම්කරුවන්හට වන්දි ගෙවීම සඳහා කම්කරු වන්දි කොමසාරිස්හට බලය පැවරී ඇත.)
- මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත ප්‍රකාරව මුස්ලිම් ප්‍රජාවගේ පවුල් අධිකරණ බලය හොබවන ක්වාසිවරුන් පත්කිරීම, පුහුණු කිරීම හා විනය පාලනය.
- 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරි පනත ප්‍රකාරව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියේ සභාපතිවරයා හා සාමාජිකයින් පත්කිරීම. (පරිපාලන විනිශ්චය අධිකාරිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා පොලිස් කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණවලට එරෙහි අභියාචන අධිකාරිය වේ.)
- 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත හා 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනත ප්‍රකාරව ගොවිජන සේවා සමාලෝචන මණ්ඩල පිහිටුවීම සඳහා පුද්ගලයින් 09 කට නොඅඩු ගණනකින් සමන්විත මණ්ඩලයක් පත් කිරීම. (ගොවිජන සේවා සමාලෝචන මණ්ඩලය ගොවිජන විනිශ්චය සභාවේ තීරණයන් පිළිබඳ මුල් අභියාචනා අධිකාරියවේ.)
- දිසා අධිකරණ හා මහේස්ත්‍රාත් අධිකරණ සම්බන්ධවත්, සමස්ථ අධිකරණ කාර්යය මණ්ඩලය සම්බන්ධවත් තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉදිරිපත් කර ඇති ඉල්ලීම් සම්බන්ධව 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනතේ විධි විධාන ප්‍රකාරව තොරතුරු නිලධරයා සහ නම් කළ නිලධරයා ලෙස කටයුතු කිරීම.

- 1950 අංක 09 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනත ප්‍රකාරව අභියාචනා විභාග කරනු ලබන ඉඩම් අත්පත් කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය සඳහා සභාපති ඇතුළුව සමාජිකයින් 16 දෙනෙකු පත් කිරීම සඳහා නිර්දේශ ලබා දීම.


- 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ පනත හා 2011 අංක 05 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත ප්‍රකාරව දරුවන් විසින් රැකබලා නොගන්නා දෙමව්පියන්ගේ නඩත්තු අයදුම්පත් තීරණය කරන වැඩිහිටි නඩත්තු මණ්ඩලයේ සභාපති සහ අනෙකුත් සාමාජිකයින් පත් කිරීම.

1.3 අධිකරණ සේවා කොමිෂන් සභාවේ ආයතනික ව්‍යුහය සහ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ ආයතනික ව්‍යුහය


අධිකරණ සේවා කොමිෂන් සභාවේ ආයතනික ව්‍යුහය



අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ ආයතනික ව්‍යූහය



අධිකරණ පද්ධතියේ ආයතනික ව්‍යූහය



ආයතනයේ ප්‍රගතිය හා ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග

2.1 2025 වර්ෂයේදී යුක්තිය පසිඳලීමේ කාර්යය පහසු කිරීම, කාර්යක්ෂම කිරීම, වේගවත් කිරීම සහ ශක්තිමත් කිරීමෙහි ලා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග හා එහි ප්‍රගතිය

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අධීක්ෂණයට යටත් අධිකරණ හා යුක්තිය පසිඳලීමේ ආයතනද ඒ හා සම්බන්ධ අනෙකුත් ආයතනද සමඟ මනා සම්බන්ධතාවයක් ගොඩ නඟා ගනිමින්, අධිකරණ සේවා කොමිෂන් සභාව යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට හා එය අප්‍රමාදව සිදු කිරීමට අවශ්‍ය කටයුතු හා ක්‍රියාමාර්ග ගෙන ඇත.

2025 වර්ෂයේ ජනවාරි මස 01 දින සිට දෙසැම්බර් මස 31 යන කාලපරාසය තුලදී රැස්වීම් 31 කට අධික සංඛ්‍යාවක් පවත්වමින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ විෂයයපථය තුලට ගැනෙන අධිකරණ වල පරිපාලන කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය තීන්දු තීරණ ගෙන ඇත.

- 2025 වර්ෂය ආරම්භයේදී උපලේඛනගත රජයේ නිලධාරී සේවයේ (එනම් අධිකරණ කාර්යය මණ්ඩලයේ) සේවක පුරප්පාඩු 1420 ක් පැවතිනි. 2025.01.01 දින සිට 2025.12.31 දක්වා කාල සීමාව තුලදී අධිකරණ භාෂණ පරිවර්තක නිලධාරීන් 07 දෙනෙකු හා අධිකරණ පවුල් උපදේශක නිලධාරීන් 20 දෙනෙකු බඳවා ගන්නා ලද අතර, 2025.12.31 වන විට උපලේඛනගත රජයේ නිලධාරී සේවයේ (එනම් අධිකරණ කාර්යයමණ්ඩලයේ) පැවති සේවක පුරප්පාඩු සංඛ්‍යාව 2313 ක් දක්වා ඉහළ ගොස් ඇත. තවද මෙම වර්ෂය තුළ උපලේඛනගත රජයේ නිලධාරී සේවයට 911 ක් බඳවා ගැනීමට අවසර ලබා දී ඇත.
- එසේම 2024 වර්ෂය සඳහා අධිකරණ නිලධාරීන් 50 දෙනෙකු (දිසා විනිශ්චයකාරවරුන්/මහේස්ත්‍රාත්වරුන් 46ක් හා කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන් 04ක්) බඳවා ගැනීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කරන ලද අතර, 2024 වර්ෂය අවසන් වීමට ප්‍රථම එම නවක අධිකරණ නිලධාරීන් කණ්ඩායම බඳවාගැනීමට කොමිෂන් සභාව සැලසුම්කොට තිබුණද (අදාල බලධාරීන් වෙතින් අවශ්‍ය ප්‍රතිපාදන ලැබීමට යටත්ව) 2024 වර්ෂය අවසන් වනතෙක් එම නවක විනිසුරුවරුන් බඳවා ගැනීම සඳහා අවශ්‍යවන ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාද විය. කෙසේ නමුත් 2024.08.25 වන දින පවත්වන ලද ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත හා ඉන් අනතුරුව පැවති සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත 2025.04.01 වන දින නව අධිකරණ නිලධාරීන් 50 දෙනෙකු (දිසා විනිශ්චයකාරවරුන්/මහේස්ත්‍රාත්වරුන් 46ක් හා කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන් 04 දෙනෙකු) බඳවා ගන්නා ලදී. තවද 2025.11.19 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය අනුව කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන් 09 දෙනෙකු අධිකරණ නිලධාරීන් ලෙස බඳවා ගන්නා ලදී.

- ඉහත සඳහන් පරිදි මානව සම්පත් හිඟය පිරවීම සඳහා සඳහා අවශ්‍ය අවසරය හා ප්‍රතිපාදන ලබා දීමට බලධාරීන් අසමත්වීම හේතුවෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ නිශ්චිත ව්‍යාපෘති / වැඩසටහන් බොහෝමයක් ක්‍රියාත්මක කිරීමට හා/හෝ සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

- එම නිශ්චිත ව්‍යාපෘති/වැඩසටහන් නම්;

  ↳ නඩු කටයුතු ප්‍රමාදය අවම කරනු වස් හා ගොඩගැසී ඇති නඩු අවසන් කරනු වස් අධිකරණ අමාත්‍යාංශය හා එක්ව ක්‍රියාවට නඟන ලද **"**අධිකරණ සංඛ්‍යාව වැඩි කිරීමේ ව්‍යාපෘතියේ**"** යෝජනාවන්ට අනුකූලව නව අධිකරණ පිහිටුවීම, නව අතිරේක අධිකරණ පිහිටුවීම, සංචාරක අධිකරණ ස්ථිර අධිකරණ බවට පරිවර්තනය කිරීම සහ ඒකාබද්ධ අධිකරණ මහේස්ත්‍රාත් අධිකරණ හා දිසා අධිකරණ වශයෙන් වෙන් වෙන්ව පිහිටුවීම.

  ↳ නිශ්කාෂණය නොකරන ලද නඩු භාණ්ඩ විශාල වශයෙන් ගොඩගැසුණු අධිකරණවල එම නඩු භාණ්ඩ කඩිනමින් නිශ්කාෂණය කිරීම අධීක්ෂණය කරනු පිණිස **"**අතිරික්ත අතිරේක**"** පදනමින් අළුතින් බඳවාගන්නා ලද විනිශ්චයකාරවරුන් කෙටි කාලසීමාවන් සඳහා පත්කිරීම.

  ↳ විශාල වශයෙන් කල් ගත වූ නඩු බහුල අධිකරණවල නඩු කටයුතු කඩිනමින් විසඳීම සඳහා **"**අතිරික්ත අතිරේක**"** පදනමින් විනිශ්චයකාරවරුන් පත්කිරීම.

- අධිකරණ සේවයේ (විනිශ්චයකාරවරුන් හා අධිකරණ නිලධාරීන්) සහ උපලේඛනගත රජයේ නිලධාරී සේවයේ (අධිකරණ කාර්යය මණ්ඩලයේ) පවතින පුරප්පාඩු පිරවීමට නොහැකි වීම නිසා (ඒ සඳහා පහසුකම් සැපයීමට අදාල බලධාරීන් අපොහොසත් වීම නිසා) යටිතල පහසුකම් දැනටමත් සපුරා ඇති අධිකරණවල පවා අධිකරණ කටයුතු ආරම්භ කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාවට නොහැකි වී ඇත.

  *උදා: අංක **05** වාණිජ මහාධිකරණය, තෙල්දෙණිය අතිරේක මහේස්ත්‍රාත් අධිකරණය, වැල්ලවාය අතිරේක මහේස්ත්‍රාත් අධිකරණය.*

- මෙම තත්වය යටතේ අධිකරණ නිලධාරියකුගේ සේවය තාවකාලිකව අත්හිටවූ අවස්ථාවක දී (විනය හේතූන් මත) හා/හෝ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය වෙත ආපසු කැඳවූ විටකදී හා/හෝ අධිකරණ නිලධරයකු හට දීර්ඝ නිවාඩු ලබා දීමේදී හෝ (ප්‍රසූත නිවාඩු යනාදී) සුදුසු අනුප්‍රාප්තිකයෙකු ලැබෙන තුරු එවැනි අධිකරණවල අධිකරණ කටයුතු තාවකාලිකව නතර කිරීම හැර වෙනත් විකල්පයක් නොමැති වූ අවස්ථාද ඇත.

  ඒ අනුව පසුගිය කාල සීමාව තුල පහත දක්වා ඇති අධිකරණ තාවකාලිකව වසා දැමීමට අධිකරණ සේවා කොමිෂන් සභාවට සිදුවිය.

උදා: *අනුරාධපුර අතිරේක මහේස්ත්‍රාත් අධිකරණයක් තාවකාලිකව වසා දැමීම,*

රත්නපුර අතිරේක දිසා අධිකරණයක් තාවකාලිකව වසා දැමීම,

කෑගල්ල අතිරේක දිසා අධිකරණයක් තාවකාලිකව වසා දැමීම හා

වරකාපොල අතිරේක දිසා අධිකරණය තාවකාලිකව වසා දැමීම.

- ඉහත පරිදි අධිකරණ ක්ෂේත්‍රයේ පවතින උග්‍ර මානව සම්පත් හිඟය හේතුවෙන් දිවයින පුරා පවතින අධිකරණ කලමනාකරණය හා පරිපාලනය කිරීම දැඩි අභියෝගාත්මක තත්වයකට පත්ව ඇත.

- එවැනි අවස්ථානුගත කරුණු යටතේදී පවා අධිකරණවල පරිපාලනය විධිමත්ව පවත්වාගෙන යාම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිරන්තරයෙන් කොමිෂන් සභා රැස්වීම් පවත්වමින් අවශ්‍ය පරිපාලනමය තීන්දු තීරණ ගැනීමට කටයුතු කර ඇත.

- අධිකරණ කටයුතු අධීක්ෂණය කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් යොදා ගන්නා සාමාන්‍ය ක්‍රියාපටිපාටියට අතිරේකව සුදුසු පසුවිපරම් යාන්ත්‍රණයක් මගින් කඩිනම් ප්‍රතිකර්ම සැපයීමේ අපේක්ෂාවෙන් අධිකරණවල බිම් මට්ටමේ පවතින ගැටලු/ඌණතා හඳුනා ගැනීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාවේ ගරු සාමාජික විනිසුරුතුමෙකු හා අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ සහභාගිත්වයෙන් ‘‘හදිසි අධිකරණ පරීක්ෂණ’’ (Sudden Court Inspections) පැවැත්වීමට කටයුතු කර ඇත.

- අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය කිරීම සඳහා ගරු අග්‍රවිනිශ්චයකාරතුමාගේ උපදෙස් පරිදි ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ආරම්භ කර ඇති “Case Management and Digitalization of the Court System – **e courts**” නම් ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම. මේ යටතේ අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය හඳුන්වාදීම සඳහා පියවර ගැනීම. මෙහිදී Clean Sri Lanka වැඩසටහන යටතේ මේ සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, ඒ සඳහා ප්‍රසම්පාදන කටයුතු පිලියෙල කර කැබිනට් අනුමැතිය සඳහා මේ වන විට යොමු කර ඇත.

- රජයේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රතිසංස්කරණ යටතට අයත් අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ (IMF) විස්තීර්ණ අරමුදල් පහසුකම් වැඩසටහනට (Reform Commitment in the Government Action Plan of the IMF Extended Fund Facility Program) ඇතුළත් කිරීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාවට අදාළව සකස් කරන ලද නිර්දේශිත ප්‍රතිපත්තිවලට අදාලව (Policy Recommendations) කටයුතු සිදු කිරීම.

- අධිකරණ සේවා කොමිෂන් සභාවට අදාළව අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ (IMF) විස්තීර්ණ අරමුදල් පහසුකම් වැඩසටහනට ඇතුළත් ප්‍රධාන කරුණු/ ක්‍රියාකාරකම් (Key Milestones/Activities referred to under Reform Commitment in the Government Action Plan of the IMF Extended Fund Facility Program) සම්බන්ධයෙන් “ක්‍රියාකාරී අයවැය සැලැස්මක්” සැකසීමට පියවර ගන්නා ලදී.

- අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ (IMF) විස්තීර්ණ අරමුදල් පහසුකම් වැඩසටහනේ ඇතුළත් ප්‍රධාන කරුණු/ ක්‍රියාකාරකම් ඉෂ්ට කිරීම සඳහා (මානව සම්පත්, යටිතල පහසුකම් හා අරමුදල්වල පැවතීමට යටත්ව) අධිකරණ සේවා කොමිෂන් සභාව හැකි සෑම උත්සාහයක්ම ගෙන ඇත.

- නියමිත ක්‍රමවේදය අනුගමනය කරමින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලයෙහි නව සභාපතිවරයෙකු හා සාමාජිකයන් 04 දෙනෙකු 2025.09.01 වන දින පත් කිරීමට ක්‍රියා කර ඇත.

- 2025.01.01 සිට 2025.12.31 දක්වා කාලය තුල නඩු කටයුතු ප්‍රමාදවීම් හා විනිශ්චයකාරවරුන් සම්බන්ධයෙන් ලද පැමිණිලි/පෙත්සම් 900 කට වඩා වැඩි ප්‍රමාණයකට අදාල තීන්දු/තීරණ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ලබා දී ඇත. අධිකරණ කාර්යයමණ්ඩල වලට එරෙහි ලැබී ඇති පැමිණිලි/පෙත්සම් 295 කින් 130 ක් සඳහා ප්‍රතිචාර ලබා දී ඇත. එම තීන්දු මත පදනම්ව අවශ්‍ය විමර්ශන කඩිනමින් සිදුකර එම දුක්ගැනිවිලි සඳහා විසඳුම් ලබා දීමට අධිකරණ සේවා කොමිෂන් සභාව පියවර ගෙන ඇත. එසේම තොරතුරු දැනගැනීමේ පනත යටතේ ලද ඉල්ලීම් 92 කින් 79 ක් සඳහා කඩිනම් ප්‍රතිචාර දැක්වීමට අධිකරණ සේවා කොමිෂන් සභාව ක්‍රියා කර ඇත.

- විනිශ්චයකාරවරුන් විසින් නඩු විභාග/විමසීම් කටයුතු ප්‍රමාදයකින් තොරව කාර්යක්ෂමව සිදු කරන බව සහතික කිරීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ඔවුන් සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන සුවිශේෂී කාර්ය සාධන ඇගයීම් ක්‍රමවේදය අඛණ්ඩව පවත්වාගෙන යාමට ක්‍රියා කර ඇත.

- සිවිල් සහ අපරාධ නඩු කඩිනමින් විසඳීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා, නඩු විශාල සංඛ්‍යාවක් ඇති අධිකරණ හඳුනාගෙන එවැනි අධිකරණ සඳහා පළපුරුදු විනිසුරුවරුන් පත් කිරීමට ක්‍රියා කර ඇත.

- විවිධ පුහුණු වැඩසටහන්, වැඩමුලු, සම්මන්ත්‍රණ ආදිය සඳහා විනිශ්චයකාරවරුන් නම් කිරීම සහ තෝරා ගැනීම මගින් ඔවුන්ගේ හැකියාවන් වර්ධනයට පහසුකම් සැලසීමට පියවර ගෙන ඇත.

- අධිකරණ නිලධාරීන් හා අධිකරණ කාර්යය මණ්ඩලය සම්බන්ධයෙන් විනිවිදභාවයෙන් යුත් විධිමත් උසස්වීම් ක්‍රමවේදයක්, ක්‍රමවත් ස්ථාන මාරු ක්‍රමවේදයක්, කාර්ය සාධන ඇගයුම් ක්‍රමයක් හා නිසි විනය යාන්ත්‍රණයක් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියාවේ යොදවා ඇත. තවද අධිකරණ නිලධාරීන්ට අවශ්‍ය නිල නිවාස හා නිල රථ ආදිය ලබා ගැනීමටද අධිකරණ සේවා කොමිෂන් සභාව මැදිහත් වීම් සිදු කර ඇත.

- නව තාක්ෂණය යොදා ගනිමින් කඩිනමින් නඩු භාණ්ඩ නිශ්කාෂණය කිරීමට අදාලව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 422 හා 422 A ප්‍රකාරව නඩු භාණ්ඩ නිශ්කාෂණ කටයුතු සිදු කෙරෙන්නේද යන්න පිලිබඳ පසු විපරම් කිරීම.

(සෑම මහේස්ත්‍රාත් අධිකරණයකම අවම වශයෙන් ප්‍රසිද්ධ වෙන්දේසි 05 ක් වාර්ෂිකව පැවැත්වීමට නියම කර ඇති අතර, චක්‍රලේඛ අංක 422 A මගින් අධිකරණවල ගොඩගැසී ඇති නඩු භාණ්ඩ 2025.12.31 දිනට ප්‍රථම කඩිනමින් නිශ්කාෂණය කර අවසන් කරන ලෙසත්, ඒ සඳහා සහාය නොදක්වන විනිශ්චයකාරවරුන්ට හා අධිකරණ කාර්යය මණ්ඩලයේ නිලධාරීන්ට එරෙහිව දැඩිව පියවර ගන්නා බවත් දන්වා ඇත.)

- විනිශ්චයකාරවරුන්ට හා උපලේඛනගත රජයේ නිලධරයන්ට එරෙහිව ලැබෙන පැමිණිලි පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාව දැඩි අවධානයක් යොමු කරන අතර, එවැනි පැමිණිලි ප්‍රමාදයකින් තොරව සලකා බලා ඊට අදාලව විමර්ශන හා පරීක්ෂණ (විනය ක්‍රියා මාර්ග) ආරම්භ කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර ඇත.

  ඒ අනුව 2025.01.01 සිට 2025.12.31 දක්වා මූලික විමර්ශන 55 ක් අළුතින් ආරම්භ කර පවත්වාගෙන යනු ලබන අතර, එම කාල සීමාව තුලදී වාර්තා පිළියෙල කර අවසන් කර ඇති මූලික විමර්ශන ගණන 40 කි.

<u>දුෂ්කරතා (අඩුපාඩු)</u>

- 2025.12.31 දිනට අධිකරණ වල කාර්යය මණ්ඩල පුරප්පාඩු 2313 ක් පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස බොහෝමයක් අධිකරණ අවම කාර්යය මණ්ඩලයක් මගින් ක්‍රියාත්මක වන අතර එය අධිකරණවල ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපා ඇත.
- අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ අනුමත සේවක සංඛ්‍යාව 119 කි. 2025.12.31 දින වන විට අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සේවය කරන්නේ නිලධාරීන් 63 දෙනෙකු පමණි. පසුගිය වසර 8කට අධික කාලය තුල අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය පෙර නිමි ගොඩනැගිලි හා කන්ටේනර් බහාලුම් වලින් නිර්මිත තාවකාලික පරිශ්‍රයක සිට ක්‍රියාත්මක විය. අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ ස්ථිර ගොඩනැගිල්ල දීර්ඝ කාලයක සිට ප්‍රතිසංස්කරණය කරමින් පැවති අතර එම ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීමෙන් පසු 2025.11.10 දින සිට නැවත ස්ථිර ගොඩනැගිල්ලේ සිට රාජකාරි කටයුතු ක්‍රියාක්මක වේ.
- එම ස්ථිර ගොඩනැගිල්ලේ ඉඩකඩ සීමිත බැවින් විමර්ශන අංශය හා ලේඛනාගාරය තවමත් ක්‍රියාත්මක වනුයේ පැරණි තාවකාලික පරිශ්‍රයේ සිටම වේ.

මෙම සියලු දුෂ්කරතාවයන් මධ්‍යයේ වුවද දිවයින පුරා ඇති සියලු අධිකරණවල අධිකරණ කටයුතු ගැටලුකාරී තත්වයකින් තොරව පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අධිකරණ සේවා කොමිෂන් සභාව ක්‍රියා කර ඇත.

2.2 ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග

- සියලු අධිකරණ සඳහා වඩාත්ම ඵලදායී නඩු කළමනාකරණ පිළිවෙත් හඳුන්වා දීම.
- ගරු අග්‍රවිනිශ්චයකාරතුමාගේ උපදෙස් පරිදි අධිකරණ කටයුතුවලදී සිදු කරනු ලබන ගෙවීම් කටයුතු කාඩ්පත් මගින් **(card payment)** ගෙවීමේ හැකියාව ලබාදීමට අවශ්‍ය පියවර ගැනීම.
- අධිකරණ සේවා කොමිෂන් සභාවේ අධීක්ෂණයට යටත් අධිකරණ වඩාත් ඵලදායී සුපරීක්ෂණයට ලක් කිරීම සඳහා පෙර වර්ෂවලදී භාවිතා කරන ලද කළමනාකරණ හා පරිපාලන මෙවලම් තව දුරටත් යොදා ගැනීම.
- "හදිසි අධිකරණ පරීක්ෂා කිරීම්" (**sudden court inspections**) තව දුරටත් පුළුල් කිරීම.
- අධික ලෙස නඩු ගොඩ ගැසී ඇති අධිකරණ හඳුනා ගැනීම හා එම නඩු කඩිනමින් විසඳීමට අවශ්‍ය විශේෂ ක්‍රියාමාර්ග ගැනීම. **(** උදා-එවැනි කල්ගත වූ නඩු පමණක් විසඳීම සඳහා අතිරේක විනිශ්චයකාරවරුන් පත් කිරීම ආදිය**)**
- නිශ්කාෂණය නොකරන ලද නඩු භාණ්ඩ ගොඩගැසුනු අධිකරණ හඳුනාගෙන එම නඩු භාණ්ඩ කඩිනමින් නිශ්කාෂණය කිරීමට අවශ්‍ය විශේෂ ක්‍රියාමාර්ග ගැනීම. **(**නඩු භාණ්ඩ නිශ්කාෂණය කිරීම අධීක්ෂණය කිරීම සඳහා පමණක් අතිරේක විනිශ්චයකාරවරුන් හා කාර්යය මණ්ඩලය පත්කිරීම, නඩු භාණ්ඩ නිශ්කාෂණය කිරීම සඳහා නව තාක්ෂණය යොදා ගැනීම**)** දැනටමත් නිකුත් කර ඇති 422 **A** දරන චක්‍රලේඛයට අනුව 2025.12.31 වන දිනට ප්‍රථමයෙන් අධිකරණවල ගොඩගැසී ඇති නඩු භාණ්ඩ කඩිනමින් නිශ්කාෂණය අවසන් කර ඒ පිලිබඳව වාර්තාවක් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලෙස සියළුම විනිශ්චයකාරවරුන් වෙත දන්වා ඇත.
- එක් එක් අධිකරණවල නඩු භාණ්ඩ නිශ්කාෂණය කිරීම අධීක්ෂණය කිරීම සඳහා එක් එක් පලාත් සඳහා මහාධිකරණ විනිශ්චයකාරවරුන් පත්කොට එම අධිකරණ නිරීක්ෂණයකොට කඩිනම් පියවර ගැනීම සඳහා නියම කර තිබීම.
- විනිශ්චයකාරවරුන්ගේ කාර්යය සාධන ඇගයීමේදී නඩු භාණ්ඩ නිශ්කාෂණය කිරීම මෙන්ම විශාල වශයෙන් කල් ගත වූ පැරණි නඩු විසඳීම වෙනුවෙන්ද විශේෂ ප්‍රමුඛතාවයක් ලබාදී එම පැරණි නඩු කඩිනමින් විසඳීමට විනිශ්චයකාරවරුන් අභිප්‍රේරණය කිරීම.
- අවශ්‍ය අවසරයන් හා ප්‍රතිපාදන ලබා ගනිමින් අධිකරණ සේවයේ පවතින උග්‍ර මානව සම්පත් හිඟය (විනිශ්චයකාරවරුන් හා කාර්යය මණ්ඩල උග්‍ර හිඟය) හැකි ඉක්මණින් සපුරාලීමට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම.
- අධිකරණයන්හි සේවය කරන උපලේඛනගත සේවයට අයත් රජයේ නිලධරයන්ගේ දැනුම, කුසලතා (පරිගණක, කළමනාකරණ හා පාරිභෝගික සේවාවන්) හා ආකල්ප වර්ධනය කිරීම සඳහා දැනට පවත්වාගෙන යනු ලබන පුහුණු වැඩ සටහන් අඛණ්ඩව පවත්වාගෙන යාම සහ අමතර පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම.
- අලුතින් ඉදිකර ඇති අධිකරණ සඳහා යටිතල පහසුකම් සැපයූ වහාම ඒ සඳහා අවශ්‍ය විනිසුරුවරුන් සහ කාර්යය මණ්ඩලය පත් කිරීම.

- පැන නැගී ඇති උග්‍ර මානව සම්පත් හිඟය, යටිතල පහසුකම් ඌනතා හා අනිකුත් සීමා කිරීම් වලට අදාළ ගැටළු නිරාකරණය කර ගනිමින් අධිකරණ සේවා කොමිෂන් සභාවට අදාළව රජයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රතිසංස්කරණ යටතේ අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ (**IMF**) විස්තීර්ණ අරමුදල් පහසුකම් වැඩසටහනේ සඳහන් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම් සාක්ෂාත් කර ගැනීමට කටයුතු කිරීම.

- අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සතු සම්පත් ප්‍රවර්ධනය කිරීම.

- අධිකරණවල පවතින නඩු කළමනාකරණය සඳහා විධිමත් පියවර ගැනීමට කටයුතු කිරීම.

- සෑම අධිකරණයක් සඳහාම ඒකාකාරී නඩු අංකනය කිරීමේ ක්‍රමවේදයක් QR කේත හඳුන්වාදීමක් සහ වර්ණ පටි හඳුන්වාදීමක් සිදු කිරීමට මූලික පියවර ගැනීම.

- සමස්ථ අධිකරණ පද්ධතියම ඩිජිටල්කරණය කිරීම සඳහා අවශ්‍ය මූලික පියවර ගැනීම.

- අධිකරණ කාර්යය මණ්ඩලය බඳවා ගැනීම සඳහා අවශ්‍ය කඩිනම් පියවර ගැනීම.

- අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

- දැනට අධිකරණ අමාත්‍යාංශය යටතේ සිටින අධිකරණ සේවක මණ්ඩලය අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත අනුයුක්ත කොට ගෙන සමස්ථ අධිකරණ කාර්යය මණ්ඩලයම එකම පරිපාලනයක් යටතට ගැනීම.

- අධිකරණ කාර්යය මණ්ඩලය වෙත දේශීය හා විදේශීය පුහුණු අවස්ථා ලබා දීමට අවශ්‍ය පියවර ගැනීම.

- අධිකරණවල නඩු බෙදීයාම විධිමත් කිරීම සඳහා අවශ්‍ය දත්ත රැස් කිරීම හා පියවර ගැනීමට ක්‍රියා කිරීම.

- කම්කරු විනිශ්චයසභාවල ඇති නඩු සම්බන්ධව දත්ත රැස් කිරීමක් සිදු කිරීම හා එම කාර්යය මණ්ඩලවල දායකත්වය ලබා ගෙන කඩිනමින් නඩු අවසන් කිරීම හා කම්කරු විනිශ්චයසභා ප්‍රතිව්‍යුහගත කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

- කුසලතාමත ස්ථාන මාරු, උසස් කිරීම් ලබා දීම සඳහා අවශ්‍ය මූලික පියවර ගැනීම.

අධිකරන සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය ඩිජිටල්කරණය කිරීම මත එමඟින් ඉටු කරනු ලබන කාර්යයන් වඩාත් පුළුල්ව හා විධිමත්ව සිදු කිරීමට පියවර ගැනීම සහ දත්ත පද්ධතියක් (Database) සකස් කිරීමට පියවර ගැනීම.

තුන්වන කොටස

2025 වර්ෂය සඳහා මූල්‍ය සමාලෝචන වාර්තාව

ඒඑෆ්-එන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංඥෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	කණ්ඩායම 2025 රු.	2,024 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒඑෆ්-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		100,270,000	83,450,000	ඒඑෆ්-3
-	තැන්පතු		683,790	268,921	ඒඑෆ්-4
-	අත්තිකාරම් ගිණුම්		3,094,065	3,586,138	ඒඑෆ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		104,047,855	87,305,059	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම්				
-	නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		104,047,855	87,305,059	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		4,919,629	66,777	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම්				
	නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		99,128,226	87,238,282	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්				
94,230,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	79,881,383	68,538,768	
66,706,224	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	28,052,199	21,906,804	ඒඑෆ්-2(ii)
360,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	241,196	267,804	
-	පොළී ගෙවීම්	8	-	-	
3,776	වෙනත් පුනරාවර්තන වියදම්	9	3,776	-	
161,300,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		108,178,554	90,713,376	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	
3,800,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	926,260	134,375	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒඑෆ්-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
300,000	හැකියා වර්ධනය	14	187,000	-	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
4,100,000	මුළු මූලධන වියදම් (උ)		1,113,260	134,375	
	තැන්පතු ගෙවීම්		359,504	262,044	ඒඑෆ්-4
	අත්තිකාරම් ගෙවීම්		3,415,004	3,566,522	ඒඑෆ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		3,774,508	3,828,566	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		113,066,322	94,676,317	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(13,938,096)	(7,438,035)	
	අග්‍රිම ඇලුපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(13,938,096)	(7,438,035)	ඒඑෆ්-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒඑෆ්-3
			(13,938,096)	(7,438,035)	

2026/02/27

ඩී.එන්.ආර්.ජයරත්න
ගණකාධිකාරී
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12.

1

ඒඑසී-පී


2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තක්ෂ 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒඑසී-6	450,307,810	433,429,145
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒඑසී-5/5(ඒ)	9,217,696	8,896,757
මුදල් හා මුදල් සමාන දෑ	ඒඑසී-3	-	-
මුළු වත්කම්		**459,525,506**	**442,325,902**
ඉද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ඉද්ධ වත්කම්		8,878,694	8,882,041
දේපළ පිරියත හා උපකරණ සංචිතය		450,307,810	433,429,145
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒඑසී-5(බී)**	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒඑසී-4	339,002	14,716
අග්‍රිම ශේෂය	ඒඑසී-3	-	-
මුළු වගකීම්		**459,525,506**	**442,325,902**

පිටු අංක 07 සිට 29 දක්වා ඒඑසී 1 සිට ඒඑසී 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් කොරතුරු සහ ඇමුණුම් පිටු අංක 30 සිට 63 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025.12.17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් කොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2026/2/27	දිනය : 2026/2/27	දිනය : 2026/02/27
ප්‍රසන්න අල්විස්	ප්‍රසන්න අල්විස්	ඩී.එන්.ආර්.ජයරත්න
ලේකම්	ලේකම්	ගණකාධිකාරී
අධිකරණ සේවා කොමිෂන් සභාව	අධිකරණ සේවා කොමිෂන් සභාව	අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12	කොළඹ 12	කොළඹ 12.



2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	කණ්ඩා	
	2025 රු.	සංශෝධිත 2024 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	14,370,260	7,131,070
අග්‍රිම ලැබීම්	100,270,000	83,450,000
අත්තිකාරම් අයකර ගැනීම්	3,206,665	3,566,478
තැන්පතු ලැබීම්	683,790	268,921
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**118,530,715**	**94,416,469**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	107,795,859	90,068,797
සහනාධාර සහ මාරුකිරීම්	241,196	267,804
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	187,000	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	465,814	67,500
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	4,919,629	66,777
අත්තිකාරම් ගෙවීම්	3,643,004	3,566,522
තැන්පතු ගෙවීම්	359,504	262,044
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**117,612,006**	**94,299,444**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**918,710**	**117,025**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භූමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	7,550	17,350
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**7,550**	**17,350**
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	926,260	134,375
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**926,260**	**134,375**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(918,710)**	**(117,025)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**0**	**0**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

ඩී.එන්.ආර්.ජයරත්න
ගණකාධිකාරී
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12.

2026/01/27

වාර්තාකිරීමේ පදනම

1) පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

7) මුදල් හා මුදල් සමාන දෑ

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකිරීමේ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

2026/02/27

ඩී.එන්.ආර්.ජයරත්න
ගණකාධිකාරී
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12.

3.5 ආදායම් කාර්ය සාධනය

රු. ,000

ආදායම් සංකේතය	ආදායම් විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		ආදායම් රැස්කිරීම	
		මූලික ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	මුදල (රු.)	අවසන් ආදායම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස
අදාල නොවේ.					

3.6 ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	ප්‍රතිපාදන		තථ්‍ය වියදම්	අවසාන වෙන් කිරීමේ ප්‍රතිශතයක් ලෙස ප්‍රතිපාදන භාවිතය
	මූලික	අවසන්		
පුනරාවර්ථන	**169,900**	**161,300**	**108,178.554**	**67.07%**
ප්‍රාග්ධන	**4,100**	**4,100**	**1,113.260**	**27.15%**

3.7 මු.රෙ.208 අනුව, මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාව අනෙකුත් අමාත්‍යාංශවල නියෝජිතයෙකු ලෙස/ දෙපාර්තමේන්තුවලට වියදම් සඳහා ප්‍රතිපාදන ප්‍රදානය කිරීම.

රු. ,000

අනුක්‍රමික අංකය	කුමන අමාත්‍යාංශයෙන් / දෙපාර්තමේන්තුවෙන් ලැබුණු ප්‍රතිපාදන	වෙන් කිරීමේ අරමුණ	ප්‍රතිපාදන		තථ්‍ය වියදම්	අවසාන වෙන් කිරීමේ ප්‍රතිශතයක් ලෙස ප්‍රතිපාදන භාවිතය
			මූලික	අවසන්		
	නැත					

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	2025.12.31 දිනට සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව ශේෂය	2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාවට අනුව ශේෂය	තවදුරටත් ගිණුම් ගත කිරීමට ඇති ශේෂය	ප්‍රතිශතයක් ලෙස වාර්තා කිරීමේ ප්‍රගතිය
9151	ගොඩනැගිලි සහ ව්‍යුහයන්	**2,612.225**	**2,612.225**		
9152	යන්ත්‍රෝපකරණ සහ උපකරණ	**23,445.514**	**23,445.514**		
9153	ඉඩම්	**379,000**	**379,000**		
9154	අස්පෘශ්‍ය වත්කම්		-		
9155	ජීව වත්කම්		-		
9160	වැඩකිරීමේ ප්‍රගතිය		-		
9180	බදු වත්කම්		-		

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

* විගණකාධිපතිවරයා විසින් යොමු කරන ලද 2026.05.29 දිනැති විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව සඳහා 27 පිටුව වෙත යොමු වන්න.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. JLO/B/JSC/FA/2025/07
ඔබේ අංකය உமது இல. Your No.
දිනය திகதி Date 2026 මැයි 20 දින

ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

ශීර්ෂය 007 - අධිකරණ සේවා කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 007 - අධිකරණ සේවා කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථාකාලයේ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකරණ සේවා කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමුකරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව අධිකරණ සේවා කොමිෂන් සභාව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකභාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කළින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූලධන වියදම්

ඒසිඒ - 2 (i) මුළු ශුද්ධ ප්‍රතිපාදන රු.165,100,000ක් ද, ඒසිඒ 2 (ii) අනුව මුළු ශුද්ධ ප්‍රතිපාදන රු.165,400,000ක් වීමෙන් එම ශේෂ අතර රු.300,000ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.2 අග්‍රිම ශේෂය

ඒසිඒ 3 ආකෘතිය අනුව සමාලෝචිත වර්ෂයේ අවසානයට නොපිය වූ අග්‍රිම ශේෂය රු.4,919,629ක් විය යුතු වුවත්, කොමිෂන් සභාවට අනුව නොපිය වූ අග්‍රිම ශේෂයක් නොමැති බව දක්වා තිබුණි. ඒ අනුව වර්ෂ අවසානයට නොපිය වූ අග්‍රිම ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

ප්‍රමාණවත් පරිදි වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන්කර නොගැනීම නිසා පුනරාවර්තන වැය විෂයන් 11කට හා මූලධන වැය විෂයන් 02ක් සඳහා ප්‍රතිපාදන රු.106,276,224කින් රු.50,623,422ක් ඉනිරිව තිබූ අතර, එම ඉනිරිවීම් සියයට 25 සිට සියයට 98ක පරාසයක් ගෙන තිබුණි.

3.2 බැරකම් හා බැඳීම්වලට එළැඹීම

සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩාගාර මුද්‍රිත SA 92 ආකෘතියෙහි සමුච්චිත බැඳීම් හා බැරකම් එකතුව රු.1,492,671ක් වූ අතර, කොමිෂන් සභාව විසින් පිළියෙල කරන ලද බැරකම් පිළිබඳ ප්‍රකාශය (ඇමුණුම - (iv)) අනුව මුළු බැඳීම් හා බැරකම් වටිනාකම රු.1,796,637ක් විය. ඒ අනුව භාණ්ඩාගාර මුද්‍රිත SA 92 මුළු බැඳීම් හා බැරකම් වටිනාකම ඇමුණුම (iv) වටිනාකමට වඩා රු.303,966ක් අඩුවෙන් දක්වා තිබුණි.

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත්කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසිපරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු වුවත්, වාර්තාවේ 6.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.

3.4 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
2020 අගෝස්තු 28 දිනැති 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය හා මාර්ගෝපදේශ අංක 12 (ඊ) ඡේදය	කොමිෂන් සභාව විසින් පිළියෙල කළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි අභ්‍යන්තර විගණන සැලැස්මක් අන්තර්ගත වී නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

4.1.1 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2023 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව 2025 ජූලි 01 වන දින ද, 2024 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව 2025 දෙසැම්බර් 31 දින ද, පාර්ලිමේන්තුව වෙත සභාගත කිරීම සඳහා ඉදිරිපත්කර තිබුණි. ඒ අනුව පිළිවෙලින් දින 365ක් හා දින 180ක් ගතව තිබුණි.

4.2 ප්‍රසම්පාදනයන්

(අ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන 04 ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතු අතර, සියලුම ගණන්දීමේ නිලධාරීන් විසින් තම ආයතනයට පැවරී ඇති විෂයයන් හා කාර්යයන් අනුව ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස්කොට ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය ලබාගෙන එහි පිටපත් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, විගණකාධිපති සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු වුවත්, කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත්කර ඇත්තේ 2025 මැයි 23 වන අතර, ඒ අනුව දින 164ක ප්‍රමාදයක් පැවතුණි.

(ආ) භාණ්ඩ, වැඩ හා උපදේශන නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024, 4.1.5(අ) ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භයේ සිට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම දක්වා එක් එක් ප්‍රසම්පාදන කාර්යයන් කාලානුක්‍රමිකව විස්තර කරන ප්‍රසම්පාදන කාලසටහනක් ප්‍රසම්පාදන අස්ථිත්වයක් සතුව පැවතිය යුතු මුත්, සමාලෝචිත වර්ෂය සඳහා එසේ ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙලකර නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදනයන් සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ලබන බව සඳහන් කර තිබුණ ද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

5. තිරසාර සංවර්ධනය

5.1 තිරසර සංවර්ධන අරමුණු ඉටුකිරීමේ ප්‍රගතිය

2018 අප්‍රේල් 27 දිනැති අංක එම්එස්ඩීඩබ්/08/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් නිකුත්කරන ලද ලිපිය ප්‍රකාරව ආයතනය විසින් සමාලෝචිත වර්ෂය සඳහා තිරසර සංවර්ධන අරමුණු හා දර්ශක හඳුනාගෙන එම තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධීකරණය කිරීමට නිලධාරීන් පත්කොට තිරසර සංවර්ධන වැඩසටහන් පිළියෙල කිරීමට කටයුතු කරමින් පවතින බව දක්වා තිබුණ ද, එවැනි වැඩසටහනක් පිළියෙල කර නොතිබුණි.

6. යහපාලනය

6.1 මහජනයා වෙත සේවා ඉටුකිරීම

2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන සහ 2025 සැප්තැම්බර් 01 දිනැති අංක 05/2008 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව රාජ්‍ය ආයතන විසින් මහජනයා වෙත ලබාදෙන සේවාවන් වඩාත් විනිවිධභාවයෙන් යුතුව කාර්යක්ෂම හා ඵලදායී අයුරින් ලබාදීමට වගවීමටත්, ඒ සඳහා සම්බන්ධ වන්නා වූ සියලූ පාර්ශවයන් අතර මනා අවබෝධය සහ එකිනෙකා අතර විශ්වාසය වැඩිදියුණු කිරීම උදෙසාත්, සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම තම ආයතනය සඳහා වන පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සකස්කර ප්‍රකාශයට පත්කළ යුතු වුව ද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

6.2 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඡේද අංක 40(1) ප්‍රකාරව කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරීම සඳහා එම කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් පත්කරනු ලබන තමාගේම අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු නමුත්, කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය

තුළ ප්‍රධාන අභ්‍යන්තර විගණක හා අභ්‍යන්තර විගණක තනතුරු 02ක් අනුමත වී නිබුණ ද, එම පුරප්පාඩු වාර්තාවේ දිනය වන විටත් පුරප්පාඩුව පැවතුණි. තව ද, 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 දරන කළමනාකරණ විගණන වක්‍රලේඛයෙහි 03 ඡේදය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ සෘජු අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I පන්තිය නිලධාරියෙකුගේ ප්‍රධානත්වය දරන අභ්‍යන්තර විගණන අංශයක් සියලුම විශේෂ වියදම් ඒකක සඳහා ස්ථාපිතකළ යුතු නමුත් කොමිෂන් සභාව තුළ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිතකර නොතිබුණි.

6.3 **විගණන හා කළමනාකරණ කමිටුව**

2018 අංක 19 දරන ජාතික විගනන පනතේ 41 වගන්තිය ප්‍රකාරව, ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් තමාට සහායදීම පිණිස පත්කරනු ලබන විගණන හා කළමනාකරණ කමිටුවක් තිබිය යුතු වුවත්, කොමිෂන් සභාව විසින් එවැනි විගණන හා කළමනාකරණ කමිටුවක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් පත්කර නොතිබුණි.

7. **මානව සම්පත් කළමනාකරණය**

7.1 **අනුයුක්ත කාර්ය මණ්ඩල, තථ්‍ය කාර්ය මණ්ඩලය**

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට කොමිෂන් සභාව සඳහා අනුමත කාර්ය මණ්ඩලය 119ක් වුව ද, තනතුරු 17ක නිලධාරීන් 86ක ඌණතාවයක් ද, තනතුරු 09ක නිලධාරීන් 30ක අතිරික්තයක් ද නිරීක්ෂණය විය. ඒ අනුව කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය වර්තමාන තත්ත්වයට ගැලපෙන අයුරින් සකස්කර ගැනීමට කටයුතුකර නොතිබුණි.

කේ. කේ. එස් ජයමන්නස්
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

හතරවන කොටස

කාර්යසාධන දර්ශක

4.1 2025 වර්ෂයේ ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම

අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තථ්‍ය නිමැවුම			
		100% - 90%	89% - 75%	74% - 50%	49% - 0%
A -1	මුල් අවස්ථා අධිකරණ විනිසුරුවරුන්, දිසා විනිසුරුවරුන්, මහේස්ත්‍රාත්වරුන් සහ කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් බඳවා ගැනීම හා පත්කිරීම			66%	
A -2	අධිකරණ නිලධාරීන්ගේ හා කම්කරු විනිශ්චය සභාපතිවරුන්ගේ උසස්වීම්, වාර්ෂික වැටුප් වර්ධක, ස්ථාන මාරු කටයුතු සහ විවිධ ඉල්ලීම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම	100%			
A -3	අධිකරණ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු හා නිවාඩු ගොනු පවත්වා ගැනීම	100%			
A -4	කම්කරු වන්දි කොමසාරිස් සහ නියෝජ්‍ය කම්කරු වන්දි කොමසාරිස් බඳවා ගැනීම, පත් කිරීම සහ ගොවිජන සමාලෝචන මණ්ඩල සඳහා හා පරිපාලන අභියාචන විනිශ්චයාධිකාර වැඩිහිටි නඩත්තු මණ්ඩලය සඳහා සාමාජිකයින් බඳවා ගැනීම හා පත්කිරීම	100%			
A -5	අධිකරණ නිලධාරීන් හා අධිකරණ පද්ධතිය සම්බන්ධ විවිධ චක්‍රලේඛ සැකසීම හා නිකුත් කිරීම	100%			
A -6	අධිකරණයන්හි පවතින නඩු පිළිබඳ සංඛ්‍යා ලේඛන ඊමේල් පණිවිඩ මගින් මාසිකව ලබාගෙන එම සංඛ්‍යා ලේඛන පරිගණකගත කිරීම, වාර්තා සකස් කිරීම හා විනිශ්චයකාරවරුන්ගේ වැටුප් වර්ධක සහ උසස්වීම් ලබා දීමේදී ඒ පිළිබඳ සලකා බැලීම.		75%		
A -7	උපලේඛනගත රජයේ නිලධාරීන්ගේ හා සංවර්ධන නිලධාරීන්ගේ, ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු හා සේවා අවශ්‍යතාවය මත ස්ථාන මාරු සිදු කිරීම	100%			
A -8	උපලේඛනගත නිලධාරීන් සම්බන්ධව ලැබෙන පැමිණිලි පිළිබඳ කටයුතු කිරීම.				47.7%
A -9	අදාල අධිකරණවල ඉල්ලීම මත නඩු කටයුතු සඳහා සංඥා භාෂණ පරිවර්තකයින් සහ විදේශ භාෂා පරිවර්තක සේවය සඳහා භාෂා පරිවර්තකයින් යොමු කිරීම	100%			
A -10	අධිකරණවල ඉල්ලීම මත සුදුසු පරිදි අධිකරණ භාෂණ පරිවර්තක සහ අධිකරණ ලඝු ලේඛක නිලධාරීන් අනුයුක්ත කිරීම	100%			

A -11	විනිසුරුවරුන්ගේ ඉල්ලීම් මත සහ සේවා අවශ්‍යතා මත උපලේඛනගත නිලධාරීන්ගේ හා සංවර්ධන නිලධාරීන්ගේ තාවකාලික අනුයුක්තයන් සිදු කිරීම	95%			
A -12	කාර්යක්ෂමතා කඩඉම් විභාග 14 ක් පැවැත්වීම		84%		
A -13	නව සේවා ව්‍යවස්ථාව අනුව බඳවා ගැනීමේ විවෘත/සීමිත තරඟ විභාග පැවැත්වීම			50.3%	
A -14	දිවයිනේ පිහිටුවනු ලබන නව අධිකරණ සඳහා මු.රෙ. 71 අනුව අධිකරණ කාර්යය මණ්ඩලය අනුමත කරවා ගැනීම	100%			
A -15	මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සිට අධිකරණ පොත් බැඳුම්කරුවන් දක්වා විනය හා විමර්ශන කටයුතු			60%	
A -16	ලංකාව පුරා ඇති ක්වාසි අධිකරණ 65 හි පරිපාලන කටයුතු සිදුකිරීම (ක්වාසි විනිසුරුවරුන් බඳවාගැනීම හා ඔවුන්ට එරෙහිව එන පැමිණිලි සම්බන්ධව ක්‍රියාකිරීම)		75%		
A -17	දිවයිනේ සියලුම අධිකරණවල සහ මෙම කාර්යාලයේ සේවයේ නියුතු උපලේඛනගත සහ උපලේඛනගත නොවන රජයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සම්බන්ධයෙන් කටයුතු කිරීම	100%			
B -1	අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත අධිකරණ සේවය සම්බන්ධව එවනු ලබන පෙත්සම් පිළිබඳව ක්‍රියාත්මක වීම		80%		
B -2	තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ වූ කාර්යයන්		85.87%		
C -1	සාමාන්‍ය පරිපාලන සහ ගිණුම් කටයුතු පවත්වාගෙන යාම	100%			

4.2 2025 වර්ෂයේ ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ආයතනයේ කාර්ය සාධන දර්ශක

ඉහත **4.1** මගින් පෙන්වා ඇති ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට අයත් **A, B** හා **C** යන දර්ශක වලින් වෙන් වෙන්ව නිරූපිත දර්ශක වල තථ්‍ය නිමවුම් වල සාමාන්‍ය, ප්‍රධාන කාර්යසාධන දර්ශක **03**ක් වශයෙන් සාරාංශ ගත කොට පහත දක්වා ඇත.

අංකය	දර්ශකය	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තථ්‍ය නිමැවුම			
		100% - 90%	89% - 75%	74% - 50%	49% - 0%
A	අධිකරණ සේවා කොමිෂන් සභාවේ විෂය පථයට යටත් සහ ව්‍යවස්ථාදායකය මගින් බලය පවරා ඇති තනතුරු සඳහා බඳවා ගැනීම, පත්කිරීම, අනුයුක්ත කිරීම, ස්ථාන මාරු කිරීම, විනය හා විමර්ෂණ කටයුතු, වැටුප් වර්ධක, සේවයේ උසස් කිරීම් හා පුහුණු කිරීම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම.	-	75%	-	-
B	පොදු මහජනතාව අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන පැමිණිලි, තොරතුරු දැන ගැනීමේ පනත යටතේ සිදු කරන ඉල්ලීම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම.	-	85.87%	-	-
C	අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාන්‍ය පරිපාලනය සහ ගිණුම් කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම.	100%	-	-	-

තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
තිරසාර සංවර්ධනය උදෙසා සැමට සාමකාමී හා සාධාරණ සමාජයක් ඇති කිරීම, සියලු දෙනාට සාධාරණත්වයත්, නීතියේ රැකවරණයත් ස්ථාපිත කිරීම, සියලු මට්ටම් වලින් වගවීම හා කාර්යක්ෂමතාවයෙන් යුත් යුක්තිය පසිඳලන ආයතන ස්ථාපිත කිරීම	ජාතික මට්ටමින් නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම සහ සැමට යුක්තිය සඳහා සමාන ප්‍රවේශයක් ඇති කිරීම හා සෑම මට්ටමකින්ම ඵලදායී, විනිවිද, වගවීමක් සහිත යුක්තිය පසිඳලන ආයතන ස්ථාපිත කිරීම	තොරතුරු දැන ගැනීමේ පනත මගින් ඉදිරිපත් කල ඉල්ලීම් ගණන හා ඒ සඳහා ප්‍රතිචාර ලබා දීමේ ප්‍රතිශතය	-	-	85.87%
		අධිකරණ නිලධාරීන් හා කාර්යමණ්ඩලය සම්බන්ධව ලද පෙත්සම් ගණන හා ඒ සඳහා ප්‍රතිචාර ලබා දීමේ ප්‍රතිශතය	-	73.64%	-
		නඩු කටයුතු සම්බන්ධව ලද පෙත්සම් ගණන හා ඒ සඳහා ප්‍රතිචාර ලබා දීමේ ප්‍රතිශතය	-	-	83.33%

* අධිකරණ නිලධාරීන්, කාර්ය මණ්ඩලය හා නඩු කටයුතු සම්බන්ධව ලැබෙන පැමිණිලි/ඉල්ලීම් පිලිබඳව ක්‍රියාමාර්ග ගැනීමේදී, එම ගනු ලබන ක්‍රියාමාර්ග හා සබැඳිව ප්‍රතිචාර දැක්විය හැකි අවස්ථාවන්වලදී පමණක් එම පැමිණිලි/ඉල්ලීම් ඉදිරිපත් කල පාර්ශවයන්ට ඒ සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමට ක්‍රියා කරනු ලබයි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පිළිබඳ සාරාංශය

2025 වර්ෂයට අදාල අධිකරණ සේවා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පිළිබඳ සාරාංශය

6.1 අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩල විස්තරය

තනතුර	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු/(අතිරික්ත) සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	**15**	**9**	10/ (04)
තෘතියික	06	8	04/ (06)
ද්විතියික	**73**	34	55/ (16)
ප්‍රාථමික	**25**	12	17/ (04)
මුළු සංඛ්‍යාව	**119**	**63**	86/ (30)

6.2 අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ හිඟ කාර්ය මණ්ඩල කළමනාකරණය පිළිබඳ විස්තරය

2025.12.31 දිනට අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ තථ්‍ය සේවක සංඛ්‍යාව 63 කි. මෙම ලේකම් කාර්යාලයේ විවිධ තනතුරු වල පුරප්පාඩු සංඛ්‍යාව 86 ක් වන අතර එය අනුමත සේවක සංඛ්‍යාවෙන් 72.26% ක ප්‍රතිශතයක් ගනී. විවිධ තනතුරු සඳහා පවතින එම පුරප්පාඩු 86 න් 30 ක් අධිකරණ නිලධරයන්ගේ හා උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවට අයත් නිලධාරීන්ගෙන් පූරණය කර ගනිමින් රාජකාරී ඉටු කර ගැනීමට කටයුතු කර ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ රාජකාරී කටයුතු සිදුකරනු ලබන්නේ සීමිත ඉඩකඩ සහිත ගොඩනැඟිල්ලක වන අතර මෙම නිලධාරීන් පූරණය කර ගැනීම මත වැඩිවන අතිරික්ත කාර්යය මණ්ඩලය සඳහා ඉඩ පහසුකම් නොමැති බව බැවින් එම බඳවා ගැනීම් සිදු කර නොමැත.

6.3 මානව සම්පත් සංවර්ධනය

අධිකරණවල සේවයේ නියුතු උපලේඛනගත නිලධාරීන් සඳහා පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන්වල සාරාංශය - 2025

අනු අංකය	පුහුණු වැඩසටහන	මාධ්‍යය	දින ගණන	පැවැත්වූ වැඩසටහන් ගණන	සහභාගී වූ නිලධාරීන් ගණන
01	සිවිල් නීතිය, අපරාධ නීතිය, සාමාන්‍ය පරිපාලනය සහ කාර්යාල කළමනාකරණය හා විනය කාර්යය පටිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන	සිංහල	03	08	219
02	අධිකරණ පවුල් උපදේශක නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන	සිංහල	05	01	24
එකතුව				09	243

අනුකූලතා වාර්තාව

7. අනුකූලතා වාර්තාව

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතා	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දින ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.6	වෙනත්	-		
2	**පොත් සහ ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		

2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල නොවේ	කාර්ය මණ්ඩලය සඳහා ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොමැත	ඉදි කිරීමට නියමිත අධිකරණ සේවා කොමිෂන් සභා නව ගොඩනැඟිල්ල ඉදිකර අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ **(CIGAS)** පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය **(GA-N20)** යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රේ. 135)**			

3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	කාර්ය මණ්ඩලය සඳහා ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොමැත	ඉදි කිරීමට නියමිත අධිකරණ සේවා කොමිෂන් සභා නව ගොඩනැඟිල්ල ඉදිකර අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට **(NDB)** නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

4.5	වාර්ෂික මූදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණන**			
6.1	මු.රෙ. **134(2) DMA/1-2019** අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	කාර්ය මණ්ඩලය සඳහා ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොමැත	ඉදි කිරීමට නියමිත අධිකරණ සේවා කොමිෂන් සභා නව ගොඩනැඟිල්ල ඉදිකර අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	කාර්ය මණ්ඩලය සඳහා ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොමැත	ඉදි කිරීමට නියමිත අධිකරණ සේවා කොමිෂන් සභා නව ගොඩනැඟිල්ල ඉදිකර අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	කාර්ය මණ්ඩලය සඳහා ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොමැත	ඉදි කිරීමට නියමිත අධිකරණ සේවා කොමිෂන් සභා නව ගොඩනැඟිල්ල ඉදිකර අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම

6.4	මූදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ	කාර්ය මණ්ඩලය සඳහා ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොමැත	ඉදි කිරීමට නියමිත අධිකරණ සේවා කොමිෂන් සභා නව ගොඩනැඟිල්ල ඉදිකර අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	**DMA** චක්‍රලේඛ 1 – 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම	අනුකූල නොවේ	කාර්ය මණ්ඩලය සඳහා ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොමැත	ඉදි කිරීමට නියමිත අධිකරණ සේවා කොමිෂන් සභා නව ගොඩනැඟිල්ල ඉදිකර අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛනයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සූදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ වාර්තා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ	මාසික සාරාංශ වාර්තා සකස් කොට මේ වන විට විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.	
9.2	වාහන ගර්හිත වී මාස **06** කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම් නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			

10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාල නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මූ.රෙ. 91(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		

13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අදාල නොවේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අදාල නොවේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		

15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
	මූ.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	හිඟ ආදායම් නොමැත		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ කාර්යය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්යය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති **MSD** චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවත් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	-	පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීමට කටයුතු කරමින් පවතී.
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	-	පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීමට කටයුතු කරමින් පවතී.
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	-	මානව සම්පත් සැලැස්ම සකස් කරමින් පවතී
19.2	කාර්යය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	-	මානව සම්පත් සැලැස්ම සකස් කරමින් පවතී
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතය පදනම් කර ගෙන සමස්ත කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	-	මානව සම්පත් සැලැස්ම සකස් කරමින් පවතී
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ	-	

20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		